කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (විශේෂ) - සිව්වන වසර
සෙමෙස්තර අවසාන පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2021/2022
**DMG 4179 : නාගරික සැලසුම් සහ ප්‍රතිපත්ති සඳහා ප්‍රජාවිද්‍යාව**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය: පැය දෙකයි (02)

**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.**

---

01. අ) රටක නාගරික ජනගහන ගතිකයන් අධ්‍යනය කිරීම සඳහා භාවිතා කල හැකි ප්‍රජාවිද්‍යාත්මක දත්ත මූලාශ්‍ර මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 08)

ආ) "නාගරික ප්‍රදේශ නිර්වචනය කිරීම සඳහා විවිධ රටවල් විවිධ නිර්ණායක භාවිතා කරයි." මෙම ප්‍රකාශය ඕනෑම රටවල් හතරක් උදාහරණයට ගනිමින් පරීක්ෂා කරන්න.

(ලකුණු 12)

02. අ) නාගරීකරණයේ ප්‍රජාවිද්‍යාත්මක සහ ආර්ථික පැතිකඩ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) දියුණු හා දියුණු වෙමින් පවතින රටවල නාගරික මට්ටම් හා ප්‍රවණතාවන්හි ඔබ නිරීක්ෂණය කළ ප්‍රධාන ලක්ෂණ උදාහරණ සපයමින් පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

03. අ) දියුණුවෙමින් පවතින රටවල නාගරික ජනගහන ගතිකයන් ශ්‍රී ලංකාව ඇතුළුව ඕනෑම දියුණුවෙමින් පවතින රටවල් දෙකක් නිදසුනට ගනිමින් පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාවේ නාගරික ජනගහන ගැටළු කෙරෙහි බලපාන නිශ්චායකයන් කෙටියෙන් විමසන්න.

(ලකුණු 10)

04. අ) වසර 2030 වනවිට රටවල් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තුවන 11 (එකොළොස් වැනි) තිරසාර සංවර්ධන ඉලක්කය සහ එහි අභිමතාර්ථ විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) 11 (එකොළොස් වැනි) තිරසාර සංවර්ධනය ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා ජනගහනය කේන්ද්‍රකරගත් නාගරික සැලසුම් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

05. අ) දකුණු ආසියාව තුළ මතුවෙමින් පවතින නාගරික ජනගහන ගැටළු උදාරණ දක්වමින් විමසන්න.

(ලකුණු 10)

ආ) රටක නාගරීකරණ ගැටලු ආමන්ත්‍රණය කිරීමෙහි ලා නාගරික ප්‍රතිපත්ති වල කාර්යභාරය සුදුසු උදාහරණ සමගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)